# සමාජගත "නාග"සංකල්පය ලාංකේය කලාව තුළ ප්‍රතිබිම්බිත ස්වභාවය පිළිබඳ අධ්‍යයනයක් (කැටයම් සහ මූර්ති කලාව ඇසුරෙන්)

ඒ. ජී. ප්‍රභාෂා දිල්ෂානි
කැලණිය විශ්වවිද්‍යාලය
prabhashadilshani8@gmail.com

**සාරසංක්ෂේපය**

"නාග"නමින් හඳුන්වනු ලබන උරග විශේෂයෙහි ඇති ප්‍රබල ගති ස්වභාව නිසා නාගයන් යනු වන්දනීයත්වයට පත්වන සත්ත්ව විශේෂයක් බවට පත්ව තිබේ. නාග රූපය සිංහල සමාජ -සංස්කෘතිය හා බෞද්ධ දර්ශනය තුළ මුල් බැසගෙන ඇති ආකාරය අනුව නාගයන් පදනම් කරගනිමින් ගොඩනැගුණු නාග සංකල්ප රාශියක් දක්නට හැකි වේ. එනම් නාග රූපය මඟින් ගින්න, ජලය, වර්ෂාව, ශක්තිය, ලිංගිකත්වය, ප්‍රඥාව, වෛරය, ධනය, බලය, තෘෂ්ණාව, සෞභාග්‍යය, ආරක්ෂාව, උසස්බව, කාලය, සෞඛ්‍ය සනීපාරක්ෂාව හා ශ්‍රේෂ්ඨත්වය වැනි සන්නිවේදනාර්ථ නිරූපණය වේ. කිසියම් ජන කොට්ඨාසයක් නියෝජනය කරන ගෝත්‍රික සංකේතයක් ලෙස ද, මූර්ති ශිල්පයට එක් වූ නාග සංකල්පය මඟින් කිසියම් දාර්ශනික අදහසක් ලෝකයට කියාපෑමට කලාකරුවා සමත් ව තිබේ. විවිධ ප්‍රකාශන අර්ථ මූලික කරගනිමින් සමාජගත වී ඇති නාග රූපය කැටයම් හා මූර්ති කලාව මඟින් සංකේතවත් කරන්නේ කෙබඳු ආකාරයෙන් ද? යන්න පර්යේෂණ ගැටලුව වේ. සමාජගත වූ සංකල්පයන් කලාවට එක්වන ස්වභාවය හා මූර්ති හා කැටයම් කලාව සඳහා පදනම් වූ නාග සංකල්පයේ විශේෂතා හඳුනා ගැනීම මෙම පර්යේෂණයේ ප්‍රධාන අරමුණයි. ගුණාත්මක පර්යේෂණ ක්‍රමය යටතේ ප්‍රාථමික දත්ත අධ්‍යයනය කිරීමත්, ද්විතීයික හා තෘතීයික දත්ත ඔස්සේ පර්යේෂණය සිදුකිරීමත්, එමඟින් නිශ්චිත නිගමනයකට එළඹීමත්, අපේක්ෂිත විය. මේ අනුව දුරාතීතයේ පටන් නූතනය දක්වා බෞද්ධ හා හින්දු මූර්ති ආශ්‍රිතව නාගයා සංකේතවත් කළ නිර්මාණ විශාල ප්‍රමාණයක් දක්නට ඇති බවත්, එම නිර්මාණ විවිධ සන්දර්භ ඔස්සේ විද්‍යාමානවන බවත් හඳුනාගත හැකි විය. විශේෂයෙන් ම කැටයම් හා මූර්ති කෙරෙහි නාග රූපයේ බලපෑම ප්‍රබල ය. මුරගල, වාහල්කඩ, කොරවක්ගල හා මකර තොරණ යන කැටයම් පදනම් කරගනිමින් එක් එක් කැටයම් නිර්මාණ සඳහා නාග රූපය ඇතුළත් කිරීමට පාදක වූ අර්ථයන් නිශ්චය කොටගැනීමෙන් මූර්ති සහ කැටයම් කලාවට නාග සංකල්පයේ බලපෑම පිළිබඳ තොරතුරු සනාථ කොටගත හැකි විය. සමාජගත සංකල්පය ම කලාව තුළින් නිරූපණය කිරීමෙහි ලා කලාකරුවාගේ නැඹුරුව කෙසේදැයි ඒ අනුව හඳුනාගත හැකි වේ.

**ප්‍රමුඛපද:** කැටයම්, නාගයා, නාග සංකල්පය, මූර්ති, සංකේත

# A Study of the Concept of the Socialised "*Naga*" as Reflected in Sri Lankan Art (Based on Engravings & Sculptures)

A.G.P.Dhilshani
University of Kelaniya
prabhashadilshani8@gmail.com

**Abstract**

Cobras are worshipped because of their power in the reptile known as "Naga". This Naga image is reflected in the Sinhalese social - culture and Buddhist philosophy. Many Naga concepts based on Naga's can be seen. That is the image of the cobra represents fire, water, rain, energy, sex, wisdom, hatred, wealth, power, lust, prosperity, protection, superiority, time, health hygiene& greatness. As a tribal symbol representing a certain group of people. The artist has been able to Coney some philosophical ideas to the world through the concept of the serpent added to the sculpture. In what way is the image of the snake, which has been socialized based on various expressive? The research problem is the meanings symbolized by the art of cravings and sculpture. The main purpose of this research is to identify the characteristics of the naga concept based on the nature of socialized concepts in art and sculpture and craving art. expected to study the primary data under the qualitative research method and conduct the research through secondary and tertiary data. It is recognized that there are a large number of designs symbolizing the serpent in Buddhist and Hindu sculpture from ancient times to modern times. These designs appear i various contexts. The influence of the cobra image is particularly strong on cravings and sculptures. Based on the Muragala, Vahalkada, Koravakgala&MakaraThorana. This information about the influence of the naga concept sculpture and engravings art could be confirmed by determining the meanings based on the inclusion of the snake image in each craving. It is possible to recognize the tendency of the artist to represent the concept of socialization through art.

**Keywords:** Concept of Naga, Craving, Naga, Sculpture